අ.පො.ස. උසස් පෙළ

# බෞද්ධ ශිෂ්ටාචාරය II

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

බෞද්ධ ශිෂ්ටාචාරය II | කාලය: පැය තුනයි

උපදෙස්:

- **ප්‍රශ්න පත්‍රය කොටස් දෙකකි.**
- **I කොටසේ ප්‍රශ්න තුනක් ඇත. ඉන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු ය.**
- **II කොටසේ ප්‍රශ්න පහකි. ඉන් ප්‍රශ්න තුනක් තෝරා ගෙන පිළිතුරු සැපයිය යුතු ය.**
- **ඒ අනුව දෙවන ප්‍රශ්න පත්‍රයේ ඔබ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න ගණන පහකි.**
- **සෑම ප්‍රශ්නයකට ම ලකුණු 20 බැගින් හිමි වේ.**

බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය සංවර්ධනය සඳහා පිළිතුරු සැපයීමේ දී නිවැරදි පිළිතුරක් නිර්මාණය කරගන්නේ කෙසේ ද යන්න පිළිබඳ ව ඔබට සපයන අත්වැලක් ලෙස මෙම ප්‍රශ්න හා පිළිතුරු ඉදිරිපත් කර ඇත.

## I කොටස

01) (i) වෛශ්‍ය වර්ණයට අයත් ස්වධර්ම **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රමණ සංස්කෘතියේ අනන්‍යතා ලක්ෂණ **තුනක්** ගෙනහැර දක්වන්න. (ලකුණු 03 යි)

(iii) කාන්තා නිදහස වෙනුවෙන් බුදුසමයෙන් ගනු ලැබූ පියවර තහවුරු කිරීමට සාධක **හතරක්** ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

(iv) අකිරියවාදය පිළිබඳ බුදුසමයේ ආකල්පය දක්වන්න. (ලකුණු 05 යි)

(v) බුද්ධ කාලීන භාරතයේ කෘෂිකාර්මික ජීවන රටාවක් පැවැති බවට සාධක **හතරක්** දක්වන්න. (ලකුණු 06 යි)

02) (i) ලෝකවිදූ බුදුගුණය පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 02 යි)

(ii) ප්‍රශ්න විසඳීම සඳහා බුදුරජාණන් වහන්සේ විසින් භාවිත චතුර්විධ ක්‍රමවේදය කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 03 යි)

(iii) තාදී බුදුගුණයෙන් ශ්‍රාවකයාට ලැබිය හැකි ආදර්ශ සංක්ෂිප්ත ව ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

(iv) බුදුරජාණන්වහන්සේ ආගමික සහනශීලිතාව ප්‍රකට කළ අවස්ථා **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(v) මහාප්‍රජාපති ගෝතමිය සතුව පැවැති ගුණාංග **පහක්** දක්වන්න. (ලකුණු 06 යි)

03) (i) "න භජේ පාපකේ මිත්තේ යන ධම්මපද ගාථාව නිවැරදිව සම්පූර්ණ කරන්න. (ලකුණු 02 යි)

(ii) එම ගාථාවේ අර්ථය ලියා දක්වන්න. (ලකුණු 03 යි)

(iii) දෙමාපිය දූ දරු යුතුකම් හා වගකීම් දහය සිගාලෝවාද සූත්‍රයට අනුව නම් කරන්න. (ලකුණු 04 යි)

(iv) පුද්ගලයාගේ පරිහානියට හේතු වන පරාභව සූත්‍රාගත කරුණු **පහක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(v) පුද්ගලයාගේ මෙලොව දියුණුවට හේතු වන මංගල සූත්‍රාගත කරුණු **හයක්** පිළිබඳ කෙටි විවරණයක් සපයන්න. (ලකුණු 06 යි)

## II කොටස

- **ප්‍රශ්න පහකි. තුනකට පිළිතුරු සපයන්න.**
- **එක් ප්‍රශ්නයකට ලැබෙන ලකුණු සංඛ්‍යාව 20 කි.**

04) (i) මහින්දාගමනය ඓතිහාසික සත්‍යයක් බව සනාථ කරන සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

(ii) මිහිඳු හිමියන්ගේ ධර්මදූත සේවාවෙහි සාර්ථකත්වය කෙරෙහි බලපෑ හේතු සාධක විමර්ශනය කරන්න. (ලකුණු 10 යි)

05) (i) ධර්මශාස්ත්‍රෝන්නතිය උදෙසා අනුරාධපුර මහාවිහාරයෙන් ඉටු වූ විශිෂ්ට සේවාව ඇගයුමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(ii) පැරණි ලක්දිව රාෂ්ට්‍ර පාලනය විෂයයෙහි බුදුසමය බලපෑ අයුරු උදාහරණ මගින් පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)

06) (i) ධර්මය හා විනය ආරක්ෂා කිරීම ධර්ම සංගායනාවල ප්‍රමුඛ අපේක්ෂාව වූ බව පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

(ii) ධන පරිභෝජනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් සමාජ සහජීවනයට ඉවහල්වන ආකාරය විමසීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

07) (i) පොදු සම්පත් කළමනාකරණය පිළිබඳ ආරාමික නීති රීති හා සිරිත් විරිත් වත්මන් සමාජයට උපයෝගී කර ගත හැකි ආකාරය ඇගයීමට ලක් කරන්න. (ලකුණු 10 යි)

(ii) රහතන්වහන්සේලා ස්වභාව සෞන්දර්ය අත්විඳි ආකාරය නිදසුන් මගින් දක්වන්න. (ලකුණු 10 යි)

08) (i) බුද්ධ ප්‍රතිමාවේ ආරම්භය පිළිබඳ පවත්නා මතවාද දක්වා ගන්ධාර හා මථුරා බුද්ධ ප්‍රතිමාවල සම විෂමතා පෙන්වා දෙන්න. (ලකුණු 10 යි)

(ii) නූතන යුගයේ චිත්‍ර කලාවේ ප්‍රවණතා පැහැදිලි කරන්න. (ලකුණු 10 යි)